# ධාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

36 වන කාණ්ඩය | 01 වන කලාපය | 2019 නොවැම්බර්


## ජනාධිපති අපේක්ෂකයින් වෙත නිදහස් වෙළඳ කලාප සේවකයින් විසින් ඉදිරිපත් කරනු ලබන

# ඉල්ලීම් ප්‍රකාශනය 2019

නිදහස් වෙළඳ කලාප තුළ සිය දහඩිය ශ්‍රමය වැය කරමින් රටට විදේශ විනිමය උපයා දෙන කම්කරුවන්ගේ අයිතීන් වෙනුවෙන් වසර ගණනාවක් මුළුල්ලේ අප හඬ නගා ඇත්තෙමු. ඔවුන්ගේ අයිතීන් දිනා ගැනීමට සටන් කළෙමු. එහෙත් කාලානුරූපීව ඔවුන් මුහුණ පාන ගැටළු ද විවිධාකාරයෙන් මතුවීම තවදුරටත් සිදුවේ.

බහුතර වූ කම්කරුවන් ප්‍රමාණයක් රටේ දුෂ්කර ප්‍රදේශයන්ගෙන් සහ අවම සමාජ ආර්ථික තත්වයන්ගෙන් යුත් පිරිසක් වීම නිසා ඔවුන් ආයතන තුළ මෙන්ම ඉන් පිටත ද හිංසනයන්ට හා අතවරයන්ට මුහුණ පාන අතර සිය අයිතිවාසිකම් කඩවීම් වලට ලක්වීම රහසක් නොවේ. නිරන්තරයෙන් අලුත් වන ශ්‍රම බලකායක් ඇති හෙයින් ඔවුන් දැනුවත් කිරීම සඳහා අප ගෙන යන ක්‍රියාමාර්ග උපායශීලීව අඛණ්ඩව ඉදිරියට ගෙන යා යුතුය. විශේෂයෙන්ම පශ්චාත් යුද සමය තුළ දමිළ කම්කරුවන් කලාපයට සංක්‍රමණය වීම හේතු කොට ගෙන මතු වන ගැටළු ආමන්ත්‍රණය කිරීම ද අප හමුවේ පවතී.

සංක්‍රමණික කම්කරුවන් වීම නිසාම නිදහස් වෙළඳ කලාප තුළ අත්දකින නිදහස් සංස්කෘතිය තුළ ඔවුන් අතරමං වී ඇති ආකාරය අප සැමට නොරහසකි. නිදහස් වෙළඳ කලාප පිහිටුවා වසර 40කට ආසන්න වුවද ඔවුන්ගේ නේවාසිකාගාර පහසුකම් වල සැලකිය යුතු සංවර්ධනයක් සිදුවී නොමැති අතර පොදු පහසුකම් සම්බන්ධව ද සෑහීමට පත් විය හැකි දියුණුවක් දැකිය හැකි නොවේ.

රටේ විවිධ ප්‍රදේශවලින් නිදහස් වෙළඳ කලාපයට පැමිණ නොයෙකුත් දුක්ගැහැටවලට මුහුණ දෙමින් සිය ශ්‍රමය වැය කරමින් රටට විදේශ විනිමය උපයා දෙන කම්කරු කාන්තාවන් ඇතුලු නිදහස් වෙළඳ කලාප තුළ වැඩකරන කම්කරු ප්‍රජාව වන අප, අපගේ ඉල්ලීම් ඇතුලත් මෙම සංදේශය සියලුම ජනාධිපති අපේක්ෂකයින් වෙත ඉදිරිපත් කරමු.

### මැතිවරණවලදී අපගේ වටිනා ඡන්දය භාවිතා කිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම

උතුරු නැගෙනහිර ඇතුලු රටේ සෑම පළාතකින්ම පැමිණ වෙළඳ කලාප ආශ්‍රිතව ජීවත් වන කම්කරුවන්ට මැතිවරණවලදී සිය ඡන්දය භාවිතා කළ හැකි පරිසරයන් තවමත් නිර්මාණය වී නැත. අදාල කම්හල් සහ ආයතන හිමියන් විසින් දුර ප්‍රමාණය අනුව වරුවක්, එක් දිනක් හෝ

9 වන පිටුවට...

ඇතුළු පිටු


03 පිටුව - ධාබිඳු තිස්පස් වන සැමරුම
04 පිටුව - සුව හා රුව
05 පිටුව - මිනිස්කමට ගරු කරනු
06-07 පිටුව - අපේ වැඩ
08 පිටුව - ඉල්ලීම් ප්‍රකාශනය ඉතිරිය...
08 පිටුව - ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය
10 පිටුව - සිතුවිල්ල
11 පිටුව - ප්‍රහේලිකාව

**ඩාබිඳු සාමූහිකය**

221, වෙළබඩ පාර, කටුනායක
දුර : 011 4 851 383
ඊ. මේල් : dabindu.infoco@gmail.com
Facebook : dabindu collective sri lanka

# ස්වයංපෝෂිත රටක්

මෙවර ජනාධිපති වරණය සඳහා ඡන්ද අපේක්ෂයින් 35 දෙනෙකු ඉදිරිපත් වී ඇත. මෙය පෙර පැවති මැතිවරණයන්ට වඩා වෙනස් තත්වයක් ගනී. පක්ෂ 3ක් ඉදිරියෙන් සිටින අතර එම පක්ෂ තුලින් ඉදිරිපත්වන අපේක්ෂයින් වේදිකාවල කෑ මොර ගසන්නේ ජනතාවගේ ඡන්දය ලබා ගැනීම උදෙසා නොයෙකුත් වරප්‍රසාද දෙන බවට පොරොන්දු වෙමිනි. බලයට පැමිණියොත් ලබා දෙන පහසුකම් හා බදු බරින් මුදවා සුඛිත මුදිත කරන බවත් රැකියා ප්‍රශ්ණ, වැටුප් වැඩිවීම් ගැන කථා පවත්වන්නේ අතිශයොක්තියෙනි. එකිනෙකාට අපහස උපහාස කර ගනියි විනය ගරුකත්වය නොමැතිව තමන් දරන තිළයේ වටිනාකම සමාජ මෙහෙවර නොදැන ඔවුන්ගේ මුවින් පිටකරන වචන අරුත්සුන් ඒවාය. ජනතාවගේ කැමැත්ත ගන්න දඟලන්නේ තම බලය පෙන්වා තම පවුල්වල සුබ විහරණය සඳහා බඩගෝස්තර වාදය රැක ගැනීමටය, නැතිනම් පරම්පාරවෙන් ආ බලය රැකගැනීමටය.

මේ බල ලෝභිකම් පෙන්වා පොරොන්දු රැසක් අප ඉදිරියේ තබා බලයට පොර කන්නේ අපට සේවය කරන්නද? නැත.. ඔවුන්ගේ අභිවෘද්ධිය උදෙසාය. තමන්ට බලය නැති අවස්ථාවකදී දේශපාලනයෙන් ඉවත් වී ගොස් අද වන විට කරලියට පැමිණ සිටින බොහෝ දෙනා මුල් පක්ෂය අමතක කොට ඔවුන්ගේ වාසිය තකා ප්‍රසිද්ධියේම කඩේ යන අතර උපහසාත්මකව අනෙකා විවේචනය ද සෑම වේදිකාවකම දක්නට ඇත. අප රට ජාතිය වෙනුවෙන් සේවය කිරීමට පොර බඳින අය අතර මත බේද ඇති වන බවක් දක්නට ලැබේ.

රටේ ජනගහණයෙන් 52% කන්තාවන් වුවත් ඔවුන් උසස් අධ්‍යාපනයක් ලබා සුදුසු  රැකියාවල යෙදී සිටින්නේ කීදෙනෙක්ද? කෘෂිකර්මාන්තය සමඟ ජීවන රටාව ගෙනයන්නේ මොන තරම් සුලු පිරිසක් ද අප රටේ කාන්තාවන්ගෙන් බහුතරයක් මැදපෙරදිග, තවත් පිරිසක් අඩු වැටුපට වෙළඳ කලාප තුළ ශ්‍රමය දියකරමින් සේවය කරන අතර ගොවි, ධීවර හා වතු කරයේ වැඩි ප්‍රමාණයක් කාන්තාවෝ ආර්ථික දායකත්වය සපයා ඇත. කිසිදු පාලකයෙකුගේ අවධානය ඒ දෙස යොමු වී නැත. මේ අයට ගුණාත්මක අධ්‍යාපනයක් නොලැබී යාම තුළ අඩු වැටුපට ශ්‍රමය වැය කිරිමට සිදු වී ඇති අතර ශ්‍රමයේ වටිනාකමක් ගෞරවයක් නොමැත.

කෘෂිකාර්මාන්තයෙන්ම දියුණු කළ හැකි රටක අප ජීවත් වන නමුත් ගොවිතැනට කුඹුරට බැස්ස ගොවියන්ගේ  දරුවන් මේ කාලයේ  උදැල්ල අරන් කුඹුරට බසින්නේ නැත. රබර් කිරි කපන්න, කුරුඳු තලන්න, තේ දලු නෙලන්න, ස්වයං රැකියා වලට යොමු වෙන්නේ කියෙන් කී දෙනාද. තාක්ෂණය බොහෝ දුරට රට තුල දියුණු වී ඇත. මේ කාලයේ සියලුම දෙවල් තව දුරටත් පිටරටින් ආනායනය කිරීම සුදුසු ද. භූමිය, ශ්‍රමය, ප්‍රග්ධනය තියාගෙන ඇයි තවදුරටත් එවැනි ක්‍රියාමාර්ගයන්ට යා නොහැකි. කම්කරුවන්ට රටේ දුගී දුප්පත් ජනතාවට අවශ්‍ය වන ආකාරයේ ආර්ථික සැලසුම් නොමැතිව රට තුළම නිෂ්පාදනයන් සිදු කිරිමේ හැකියාව වර්ධනය නොකර අප රට සංවර්ධනයක් තව දශක ගණනාවකින් වත් ලබාගත නොහැකිය. මේවාට වගකිව යුත්තේ දුර දක්නා දැක්මක් නොමැති පාලකයින් නොවෙද?

# ඇය

## සිතන්නට යමක්...

ස්ත්‍රීත්වය යනු ශක්තියයි. එය මෙලොව ජීවත් වන සෑම ගැහැණියක් තුළම පවතින්නා වු පොදු ධර්මතාවයකි. ගැහැණියක් සියලු පීඩාවන් දරා සිටින්නේ ඒ අනුවයි. කාන්තාවන් තුළ පවතින්නා වු ශක්තීන් හඳුනාගැනීමට ඇති අපොහොසත්කම ඇයසතු ශක්තිය දුර්වලකිරීමකි. ඒ හේතුවෙන් අපේ කාන්තාවෝ වේදනාවෙන් කල්ගත කරයි. ගැහැණියක් තුළ පවතින්නා වු ශක්තීන් ඉස්මතු කරගැනීමට ඇයට සමාජයෙන් ලැබෙන්නාවු දායකත්වය ඉතාම සීමිත ප්‍රමාණයකි. ලෝකයේ සමස්ථ කාන්තාවන්ගෙන් විශාල පිරිසක් චිත්ත පීඩාවෙන් පසුවන්නේ ඒ හේතුවෙනි.

තම ප්‍රේම සම්බන්ධතා බිඳ වැටිමේ සිට තම දුවා දරුවන් සැමියා පවුලේ අය වෙනුවෙන්. ඇතැම් විටෙක තම ස්වාමි පුරුෂයා අසනීප වි ඒකලම තම පවුලේ දෙමාපියන්ට හෝ සහෝදර සහොදරියන් අසරණ වන්නට ඉඩ ඇත. නමුත් සියල්ල සැලසුම් කරමින් මනාවට විසඳා ගැනීමේ ශක්තිය ඔබ තුළ පවති. එය ඔබ සැලසුම් නොකලත් ඔබ ඔබව පාලනය නොකලත් නිරායාසයෙන්ම ගැහැණිය සැලසුම් සහගතයි.

පවුලක් යන දැවැන්ත වෘක්ෂයේ මුදුන් මුල ඇයයි. මුදුන් මුලක් මහා පොළව දරාගෙන සියලු දේ ලබාගනිමින් වෘක්ෂයේ අතු ඉති කොල දලු පෝෂණය කරන්නාක් මෙන් නිවසක ජිවනාලිය වන මව නැතිනම් භාර්යාව මේ සියලු බර දරමින් සිටි. ගැහැණිය කිසිදු දිනක ජිවිතයෙන් පරාජය වීමට සුදානම් නැත. වැටෙන සෑම විටම වෙනදාටත් වඩා පිරිපුන් මනසකින් බුද්ධියකින් ඇය නැගී සිටී.

11 වන පිටුවට...






# ඩාබිඳු තිස්පස් වන සැමරුම

ඩාබිඳු සාමුහිකය 35 වසරක් පුරා සිදු කළ මෙහෙවර සිහිපත් කරමින් පසුගිය සැප්තැම්බර් මස 8 වන දින කටුනායක නතාලියා උත්සව ශාලාවේ දී උත්කර්ශවත් අයුරින් පැවත්විණි. අප සමඟ දිර්ඝ කාලයක් එක්ව කටයුතු කරමින් ඩාබිඳු සාමුහිකයට ශක්තියක් හා ධෛර්යයක් ලබා දෙමින් අපට අත්වැලක් වෙමින් සිටි විවිධ සිවිල් සංවිධාන නියෝජනය කරන නියෝජිතයින් ද අපගේ සමාජිකාවන් වශයෙන් කටුනායක නිදහස් වෙළඳ කලාපයේ හා උතුරු ප්‍රදේශයේ කම්කරු කාන්තාවන් පිරිසක් ද සම්බන්ධ විය. අප සංවිධානයේ ක්ෂේත්‍ර නිළධාරිණි මනීෂා ප්‍රනාන්දු මෙනවිය විසින් පැමිණ සිටින්නන් පිළිගැනීමෙන් අනතුරුව අප අතරින් සමුගත් සිවිල් සමාජයට අතිමහත් සේවයක් ඉටු කරා වු ක්‍රියාදරයින් සිහිපත් කළහ. ඉන් පසුව චාරිත්‍ර වලට මුල් තැන ලබා දෙමින් වසරින් වසර තව තවත් ඩාබිඳු සාමුහිකය ආලෝකමත් වන පැතුමෙන් පොල්තෙල් පහන දල්වීම ආරම්භ විය. අප සමඟ රැදී සිටි සිවිල් සංවිධාන නායක නායිකාවන් හා කම්කරුවන් නායක නායිකාවන් මේ අවස්ථාවට එක් විය.

කවදත් අන් ජාතියට භාෂාවට මුල් තැන දෙමින් කටයුතු කරන ඩාබිඳු සාමුහිකය පිළිගැනීමේ නර්තනය ඉදිරිපත් කිරීමට ඩාබිඳු සාමුහිකයේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සම්බන්ධීකාරිකාව වන ශ්‍රිකාන්ති මහත්මියගේ දියණියට ඇරයුම් කරන ලදි. ඉතාම ආකර්ශණීය භරත නර්තනයකින් එම උත්සව සභාව අමන්දානන්දයට පත් කළ ඇයගේ එම ඉදිරිපත් කිරීමෙන් පසුව පුරා වසර 35ක සමාජ මෙහෙවරක් සිදුකල ඩාබිඳු සාමුහිකයේ අතීතාවර්ජනයක් හා වත්මන් ගමන් මගද ඩාබිඳු සාමුහිකය වෙත ආ අභියෝග හා දිනාගත් ජයග්‍රහණයන් ද මෙතෙක් කල් ආ ගමනේදී අපට ශක්තියක් වෙමින් අප වටා රැදී සිටි සියලු දෙනා සිහිපත් කරමින් හා ස්තුති කරමින් අප සාමුහිකයේ වැඩසටහන් සම්බන්ධිකාරිකා චමිලා තුෂාරි මහත්මිය විසින් පැමිණ සිටින්නන් ආමන්ත්‍රණය කරන ලදි.

ඩාබිඳු ආරම්භ කරමින් කම්කරුවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් අරගල සිදු කරමින් 1984 තරම් පමණ දිර්ඝ කාලයක පටන් එම අවධියේ කම්කරු කාන්තාවන්ට මුහුණ දීමට සිදු වු අභාග්‍ය සම්පන්න සිදුවීම් වෙනුවෙන් නැගී සිටිමින් ඔවුන්ට ශක්තියක් වෙමින් ඔවුන් වෙනුවෙන් අරගලයේ යෙදුණු එච්.අයි සමන්මලී මහත්මිය කළ අඛණ්ඩ සේවය අගයමින් තව තවත් කම්කරුවන් වෙනුවෙන් සටන් කිරීමට ශක්තිය ධෛර්යය ලැබීමට ප්‍රාර්ථනා කරමින් 35 වසරක සේවය වෙනුවෙන් ඇයට උපහාරයක් ඩාබිඳු සාමුහිකයේ කාර්යය මණ්ඩලය විසින් ප්‍රදානය කරන ලදි.

ඉන් අනතුරුව 35 වන සංවත්සරය හා වාර්ෂික මහසභා රැස්වීම ආරම්භ විය. ඒ වෙනුවෙන් 2018 වසර හා 2019 වසරයන් හි සංවිධානයේ ප්‍රගති වාර්ථාව සභාවට ඉදිරිපත් කිරීම ව්‍යාපෘති නිළධාරිනි ජයනි ප්‍රනාන්දු සහෝදරිය විසින් සිදුකෙරිණි. ඩාබිඳු සාමුහිකය විසින් පසුගිය වසරේ ක්‍රියාත්මක කර සාර්ථක ලෙස අවසන් කරන ලද ව්‍යාපෘතින් පිළිබඳ හා මේ වන විට ආරම්භ කරමින් සිදුකරගෙන යනු ලබන ව්‍යාපෘතීන් පිළිබඳව ද මෙම ප්‍රගති සමාලෝචනය මගින් ඉදිරිපත් කෙරිණි.

දෙවැනුව වැඩසටහන් පිළිබඳ හා අප සවිධානයේ ප්‍රගතිය මෙන්ම අප ආයතනයේ මුල්‍ය වාර්ථාව ද ඉදිරිපත් කරන ලදී. ඒ වෙනුවෙන් අපගේ මුල්‍ය නිළධාරිණි මාලා හේවාවිතාරණ මහත්මිය විසින් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම වාර්තාවන් සභා සම්මත කෙරිණි. ඉන් පසුව නර්ථන අංගයකින් සභාව ප්‍රබෝධමත් කිරීමට ප්‍රභා වියත්මි දියණියට අවස්ථාව හිමිවිය. වසර ගණනාවක් පුරා අප සමඟ කටයුතු කරමින් ඩාබිඳු සාමුහිකයේ ක්‍රියාකාරි කම්කරු සමාජිකාවක් වන ජීවා දිලුරුක්ෂි මහත්මිය විසින් අප සංවිධානය වෙතින් ඇයට ඇයගේ කම්කරු අයිතීන් දිනා ගැනීමට හා ඇයගේ ජිවන තත්වයට අප විසින් ලබා දුන් සහයෝගය සිහිපත් කරමින් ඇය විසින් සම්බන්ධීකාරිකා චමිලා තුෂාරි මහත්මිය වෙත තිළිණයක් ලබා දෙනු ලැබීය. ඔවුන් අප සමඟ රැදෙමින් ඔවුන්ගේ අයිතීන් දිනා ගැනීමට ඩාබිඳු වෙතින් ලබා ගත් පන්නරය අතිමහත් යැයි ඇය පවසා සිටියේය. එය අප සංවිධානයක් වශයෙන් ලබා ගත් වටිනා ඇගයුමකි.

පසුව මහ සභා රැස්විමෙන් අනතුරුව 2019 වසරේ ඩාබිඳු සාමුහිකයේ නව අධ්‍යක්ෂක මණ්ඩලය තෝරා පත්කර ගන්නා ලදි. නව මණ්ඩලය වශයෙන් පස් දෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් ස්ථාපිත විය. එයින් අනතුරුව 35 වසර සනිටුහන් කරමින් සංවත්සරය වෙනුවෙන් සියලු දෙනාට පැමිණිම පිළිබඳ ස්තුතිය පුදකර දිවා භෝජන සංග්‍රහයකට ඇරයුම් කරමින් වැඩසටහන නිමා විය.

# පුව සහ රැව



## මරාන්තික ගැබ්ගෙල පිළිකා හඳුනා ගන්නේ කෙසේදැයි ඔබ දන්නවාද?

පිළිකා අතරින් ශ්‍රී ලංකාවේ වැඩිම කාන්තාවන් පිරිසක් ගොදුරු වන්නේ පියයුරු පිළිකාවට වන අතර එහි දෙවන තැන ගන්නේ ගැබ්ගෙල පිළිකාවයි. මාරන්තික විය හැකි ගැබ්ගෙල පිළිකාව කල්තබා ගතහොත් ඊට නිසියාකාරව ප්‍රතිකාර ලබා ගතහොත් එයින් සම්පූර්ණ සුවය ලැබීමට හැකියාව පවතිනවා. ගැබ්ගෙල පිළිකාවට ගොදුරු වන කාන්තාවන්ගෙන් 95%ක්ම ලිංගිකව සම්ප්‍රේෂණය වන HPV එනම්, "හියුමන් පැපිලෝමා" (Human Papilloma Virus) නම් වෛසරය ආසාධිත වුවන් වනවා

අඩු වයසින් ලිංගික ජීවිතය ඇරඹූ කාන්තාවන්ට, බහු පුරුෂ සේවනයේ යෙදෙන කාන්තාවන්ට, බහු ස්ත්‍රී සේවනයේ යෙදෙන පුරුෂයින් සමග ලිංගිකව සම්බන්ධ වන කාන්තාවන්ට, අනාරක්ෂිත ලිංගික සබඳතා පවත්වන කාන්තාවන්ට මෙන්ම අක්‍රීයව හෝ සක්‍රීයව දුම් පානයේ යෙදෙන කාන්තාවන්ට හා විවිධ රෝග සඳහා ප්‍රතිශක්තිකරණය හීන කරවන බෙහෙත් ගන්නා කාන්තාවන්ට ද ගැබ්ගෙල පිළිකා වැළඳීමේ අවදානමක් පවතින බව කිව යුතුයි.

පහත දැන්වෙන්නේ ගැබ්ගෙල පිළිකා අවදානමක් පවතීද යන්න කල්තබා හඳුනාගත හැකි ලක්ෂණ කිහිපයක්, ඔබත් ඒවා අත්විඳී නම් වහාම ප්‍රසව හා නාරිවේද වෛද්‍යවරයෙකු හමුවීම නුවණට හුරු ක්‍රියාවක් වනවා.

**■ යෝනි මාර්ගයෙන් අසාමාන්‍ය ලෙස ශ්‍රාවයන් පිටවීම**
පිළිකාව ගැබ්ගෙල තුළ වර්ධනය වන විට ගර්භාෂ බිත්තියේ සෛල බිඳීමකට ලක්වීම මෙයට හේතුවයි. මේ ශ්‍රාවයන් අධික දුර්ගන්ධය යුතු වනවා.

**■ අභ්‍යන්තර හා බාහිර ඇතිවන ඉන්නන්**
ප්‍රකට ප්‍රසව හා නාරිවේද වෛද්‍යවරියක් වන රෝසා මරියා ලෙම් ට අනුව මෙසේ ඇතිවන ඉන්නන් ද ගැබ්ගෙල පිළිකා ඇතිවීම සම්බන්ධයෙන් වන අනතුරුදායක සංඥාවක් ලෙෂ සැලකිය හැකියි.

**■ යෝනි මාර්ගය තුළින් සිදුවන අක්‍රමත් රුධිර වහනය**
පිළිකාව ගැබ්ගෙලේ බිත්ති මත වර්ධනය වන විට ඇති වන වියළීමේ ස්භාවය හා පටක බිඳීම නිසා වේදනාවක් හා රුධිර වහනයක් සිදුවිය හැකියි. ඇතැම් විට ගුද මාර්ගයේ හෝ මුත්‍රා කරන විට මෙය සිදුවිය හැකියි. එම නිසා ඔසප් සමයේ බාහිරව රුධිර වහනයක් සිදුවන්නේ නම් වහාම වෛද්‍ය උපදෙස් ලබා ගත යුතුයි.

**■ රක්තහීනතාවය**
ආහාර පුරුදු එලෙසම තිබියදී වුවද තෙහෙට්ටුවක් දැනීම, ස්වල්ප වශයෙන් වෙහෙසීමකට පසු වුවද හෘද ස්පන්දන වේගය අසාමාන්‍ය ලෙස වැඩි වීම, රක්තහීනතාවයේ ලක්ෂණ වනවා, ගැබ්ගෙල පිළිකාව වර්ධනය වන විට සිදුවන අක්‍රමවත් රුධිර වහනය නිසා රක්තහීනතාවය ඇතිවිය හැකි බව මතකයේ තබා ගැනීම වැදගත්.

**■ මුත්‍රා පිටකිරීමේදී ඇති වන ගැටළු**
ගර්භාෂය ප්‍රසාරණය වීම නිසා මුත්‍රාශය හා වකුගඩු තෙරපීමකට ලක් වනවා. එවිට මුත්‍රා මාර්ගය අවහිර වීමකට ලක්වන අතර ඒ හේතුවෙන් නිසියාකාරව මුත්‍රා පිටකිරීමට නොහැකි වීම සහා මුත්‍රා පිටකරන විට දැඩි වේදනාවක් ඇති විය හැකියි.

**■ දෙපාවල, උකුළු ප්‍රදේශයේ හා කොන්ද ආශ්‍රිත ප්‍රදේශයේ ඇති වන නොනවතින වේදනාව**
ගැබ්ගෙල ප්‍රසාරණය නිසා ඇති වන අභ්‍යන්තර අවයව තෙරපීම හේතුවෙන් රුධිර නාල අවහිර වීම සිදුවනවා. එම නිසා ඉහත දැක්වූ ලෙස වේදනාව ඇති වීම මෙන්ම දෙපා වල මෙන්ම ඇස්වටය ප්‍රදේශය ද ඉදිමීමකට ලක්විය හැකි.

**■ බර අඩුවීම**
පිළිකා නිසා සිදුවිය හැකි තවත් දෙයක් වන්නේ ආහාර රුචියක් නොමැති වීම හෝ ආහාර රුචිය අසාමාන්‍ය ලෙෂ අඩු වීමයි. ගැබ්ගෙල ප්‍රසාරණය වීම නිසා අමාශයේ සිදුවන තෙරපීම මෙයට හේතුවක් විය හැකියි.

කෙසේ වෙතත් ඔබ විසින් වටහා ගත යුතු වැදගත්ම දෙය නම් වන්නේ ඉහත ලක්ෂණ ඇතිවීම යනු ඔබට නියත වශයෙන්ම පිළිකාවක් වැළඳී ඇති බවට ලැබෙන සහතිකයක් නොවන බවයි. එය තීරණය කළ හැක්කේ සුදුසුකම්ලත් වෛද්‍යවරයෙකුට පමණක් වනවා. ඔබ ගැබ්ගෙල පිළිකා අවදානමක සිටිනවාද නැද්ද යන්න පිළිබඳ පැප් පරීක්ෂාවකින් කල්තියා දැනගත හැකියි. මාසික ඔසප් වීම සිදු නොවන දිනයක රජයේ රෝහලකින්, ප්‍රදේශයේ සෞඛ්‍ය නිලධාරී කාර්යාලය මඟින් පවත්වන 'සුවනාරි' සායනයකින් හෝ පෞද්ගලික රෝහලකින් ඔබට මෙම වේදනා රහිත සරල පරීක්ෂණය සිදු කර ගත හැකි. එම නිසා ඔබ සැලකිලිමත් වී මෙම තත්වයන් වළක්වා ගැනීමට කටයුතු කළ යුතුයි.

# මිනිස්කමට ගරු කරනු




1989 ලක් වැසියන්ට කිසිදා අමතක නොවන වසරකි. ඒ රට තුළ පැවති දේශපාලන අර්බුදයන් නිසාවෙන් සිදු වූ භීෂණ සමය හේතුවෙනි. එම වකවානුව තුළ සුදු වෑන් වල ගෙන ගොස් අතුරුදහන් කරවීම, වෙඩිතබා ඝාතනය කර මහ පාරේ ටයර් සෑය මත පිලිස්සුණු මල සිරුරුය. හදිසි නීතිය යටතේ අත්ඩංගුවට ගැනීම, නිතරම ගෙවල් සෝදිසි කිරීම් සැක ඇතිවන යමක් හමු වුවොත් පොලීසියට ගෙන යාම. ගෝනි බිල්ලන්, හැඳුනුම්පත් එකතු කිරීම යනාදි සිදු වීම් ගණනාවක් එම සමය තුළ සිදු විය.

සිත් පිත් නැති මිනිසුන් විසින් කළ මිනිස් ඝාතන බොහෝය, මරා පුලුස්සා දැමූ සිරුරු සතුන්ට ආහාරයක් විය. වෙඩි වැදුණු මිනිසුන්ගේ රුධිරය පොළොවට උරා ගත්තේය. ගංගා තුළ මිනිස් සිරුරු පාවිය. මිනිසුන්ගේ හිස් කබල් වැට උඩ ගසා තිබුණු අතර කැලෑ නීතියද රජ කෙරිණි.

ඉහත සඳහන් වකවානුව තුළ එනම් 1989 ඔක්තොම්බර් මස 27 වනදා නීති උපදේශක ලයනල් හා කටුනායක නිදහස් වෙළඳ කලාපයේ සේවය කල රංජිත් යන සහෝදරයින් දෙදෙනා අතුරුදහන් කර පසුව මරා පුලුස්සා රද්දේලුව මංසන්ධියේ දමා තිබුණාය. ඔවුන් කළ වරද කුමක්ද මේ තරම් පාපකාරී සිදුවීමක් කිරීමට.

රංජිත් සහෝදරයා ආයතනය තුළ සිදුවන අසාධාරණයන් වලට එරෙහි වුවා පමණක් නොව කලාපයේ අනිකුත් කම්හල් වල සිදුවන අයුක්තියට එරෙහි වෙමින් ඒ පිළිබඳ විස්තර ඩාබිඳු වලටද තොරතුරු ලබා දුන්හ. එයට විරුද්ධ වූ පාලකයින් අසාධාරණ ලෙස සේවයෙන් පහ කරන ලදී. එයට නීති උපදේශක වශයෙන් ඉදිරිපත් වූයේ ලයනල් සහෝදරයායි. ගෘහස්ථ පරීක්ෂණයක් ආයතනය තුළ සිදු කෙරිණි. නැවත රැකියාව රංජිත් සහෝදරයාට හිමිවීම නිසා දරුදවූ පාලකයින් විසින් මෙම අපරාධය සිදු කරන ලදී.

ඔබ දෙපළ රාජ්‍යද්‍රෝහීන් ලෙස හංවඩු ගැසුවත් අප දන්නා තරමින් එය එසේ නොවන්නන් බව ඉඳුරා කිව හැක. කලාපය තුළ සිදුවන අසාධාරණයන්ට එරෙහි වුවා පමණි. ඒ බව පසක් කර දිය යුතුයි. ඔබලාගේ සිරුරු භූමිදානය කිරීමට වත් අඩි හයකට හිමිකම් නොලබන්න කල පාපය කිම. ඔබලා අප අතරින් වෙන්ව වසර 29කි. නමුත් කලාපය තුළ ඔබ ඩාබිඳු රැදී ඇත. ඒ නමුත් කලාපය තුළ ඔබේ මතකයන් සමඟ ඩාබිඳු තවමත් රැදී ඇත. එම නිසා ඔබලා කළ මෙහෙවර අප ඉටු කරන්නෙමු ඒ නිසාම අතුරුදහන් වුවන්ගේ පවුල් එකතුව විසින් මෙවරද රද්දොලුව මංසන්දියේ පිහිටි අතුරුදහන් වුවන්ගේ ස්මාරයක ලඟ ඔබලා වෙනුවෙන් 2019.10.27 වන දින ස්මරණය කරන ලදී. එයට විවිධ සංවිධාන හා පුද්ගලයින්, මාධ්‍ය අංශ වලින්ද, උතුරු නැගෙනහිර සිට අතුරුදහන් වුවන්ගේ පවුල් වල දෙමාපියන් සහෝදර සහෝදරයින් භාර්යාවන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

# නායකත්ව පුහුණු වැඩසටහනක් කිලිනොච්චියේ දී



ඩාබිඳු සාමුහිකය විසින් කම්කරුවන්ගේ කුසලතා, හැකියාවන්, හඳුනාගනිමින් ඔවුන්ගේ නායකත්ව ලක්ෂණ ගොඩනගා තම අයිතීන් දිනාගැනීම උදෙසා තරුණ කම්කරු කාන්තාවන් හා පිරිමි පාර්ශවය සවිබලගැන්වීමේ අරමුණින් ක්‍රියාත්මක වන නායකත්ව පුහුණු වැඩසටහන් මාලාවේ දෙවැන්න පසුගිය සැප්තැම්බර් මාසයේ කිලිනොච්චි දිස්ත්‍රික්යේ පැවැත්විණි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය, වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව, කම්කරු නීති, වෘත්තීය සමිති නීති හා ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳව අවබෝධය මෙම වැඩසටහන් මලාව හරහා කම්කරුවන්ට ලැබේ. මෙවර පුහුණුවේ දි කම්කරු අයිතීන් පිළිබඳව සැසිය ක්‍රියාත්මක විය. කම්කරු අයිතීන් යනු කුමක්ද? ඔවුන්ට හිමි කම්කරු අයිතිවාසිකම් මොනවාද? ඒවා ආයතන තුළ ක්‍රියාත්මක වෙනවාද? කම්කරු අයිතීන් දිනා ගැනීමට අප ක්‍රියාකළ යුත්තේ කෙසේද යන්න මේ තුළින් දැනුවත් කිරීම සිදු විය. ඒ සඳහා සම්පත් දායිකාවන් ලෙස යෝගේෂ්වරී ක්‍රිෂ්ණන් මෙනවිය හා කර්තිහා තනන්ජන් මහත්මිය සම්බන්ධ විය. සහාගීත්ව ක්‍රමවේදය යටතේ පැවැත්වූ මෙම වැඩසටහන විවිධ ක්‍රියාකරකම් හා කණ්ඩායම් වශයෙන් කටයුතු කරමින් පැමිණ සිටි සියලු දෙනා ඉතා උද්යෝගීමත්ව දෙදිනක් පුරා මෙම වැඩසටහනට සම්බන්ධ විය.



# ජනාධිපතිවරණය සඳහා කම්කරුවන්ගේ ඉල්ලීම් මාලාවක් සකස් කිරීමේ වැඩසටහන

2019 ජනාධිපතිවරණ වෙනුවෙන් ඉදිරිපත් වන අපේක්ෂකයින් වෙත ලබාදීමට ප්‍රතිපත්ති මාලාවක් සකස් කිරීමට ඩාබිඳු සාමුහිකය පියවර ගනු ලැබිණි. කටුනායක නිදහස් වෙළඳ කලාපයේ හා උතුරු ප්‍රදේශයේ ඇඟලුම් කර්මාන්ත ශාලාවන් හි සේවය කරන කම්කරුවන් සම්බන්ධ කරගනිමින් ඔවුන් සමඟ ගැටලු සාකච්ඡා කරමින් මෙම ප්‍රතිපත්ති මාලාව සකස් කිරීම පසුගිය මාසයේ දී කටුනායක ඩාබිඳු කාර්යාලයේ හා වව්නියා නෙල්ලි ස්ටාර් උත්සව ශලාවේ දී පැවැත්විණි. එහිදි කටුනායක ප්‍රදේශයේ කම්කරුවන් ආමන්ත්‍රණය කිරීමට ස්ත්‍රී සම්පත් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂිකා සුමිකා පෙරේරා මහත්මිය හා උතුරේ වව්නියා කිලිනොච්චි ප්‍රදේශයන් වල කම්කරුවන් ආමන්ත්‍රණය කිරීමට නීතිඥ ස්වස්තිකා අරුලිංගම් මහත්මිය සම්පත් දායිකාවන් ලෙස සහභාගී විය. නිදහස් වෙළඳ කලාපයේ සේවය කරන කම්කරුවන් 30 දෙනෙකු හා උතුරු ප්‍රදේශයේ කම්කරුවන් 30 දෙනෙකු බැගින් මෙම සාකච්ඡා වටයන් සදහා සම්බන්ධ විය. මෙම සාකච්ඡා මගින් ලබා ගත් තොරතුරු ඇතුලත් කරමින් කම්කරුවන් වෙනුවෙන් ප්‍රතිපත්ති මාලාවක් ලෙස සකස් කෙරුණි.



# මහජන විනිශ්චය සභාව

නිදහස් වෙළඳ කලාප තුළ හා ඉන් පිටත සේවය කරන ඇඟලුම් කම්කරු කාන්තාවන්ට ආයතනය තුළ දී මඟතොටෙ දී සිදුවන ගැටලු පිළිබඳ මහජන විනිශ්චය සභාවක් පසුගිය සැප්තැම්බර් මාසයේ 8 වැනි දින කටුනායක නතාලියා උත්සව ශාලාවෙ දී පැවැත්වීය. එම විනිශ්චය සභාවේ වැඩ කටයුතු ආරම්භ කරමින් පැමිණ සිටින කම්කරුවන් හා වෙනත් සංවිධාන නියෝජිතයින් පිළිගැනිමෙන් අනතුරුව කම්කරු විනිශ්චය සභාවේ විනිශ්චය කරුවන් වශයෙන් පැමිණි වාණිජ හා කාර්මික සේවක සංගමයේ ලේකම් සුරංජය අමරසිංහ මහාතා, ලංකා බැංකු සේවක සංගමයේ උප ලේකම් කේසර කෝට්ටේගොඩ මහතා, නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මහත්මිය හා නීතිඥ ස්වස්තිකා ආරුලිංගම් මහත්මිය මෙම විනිශ්චය සභාවට පිළිගනු ලැබුණි. කටුනායක නිදහස් වෙළඳ කලාපය නියෝජනය කරමින් කම්කරු කාන්තාවක් ද බියගම කලාපය නියෝජනය කරමින් එහි සිට පැමිණි කාන්තාවට හා උතුරු ප්‍රදේශයේ වව්නියා හා කිලිනොච්චි දිස්ත්‍රික්කයන් වල ඇඟලුම් සේවිකාවන් දෙදෙනෙකුට ද ඔවුන් මුහුණපාන ආයතනයේ මඟතොට හා නේවාසිකාගාර ගැටලු හා සමස්ථ කම්කරුවන් මුහුණපාන තත්වයන් සාක්ෂි කරුවන් ලෙස සහභාගි විය. එම කම්කරුවන් තම ගැටලු සභාවට ඉදිරිපත් කරමින් විනිශ්චය සභාවේ අදහස් විමසීමක් සිදු විය. පසුව එම ඉදිරිපත් කර ගැටලු සැළකිල්ලට ගනිමින් ඉදිරියේදි අදාල පාර්ශවයන් සමඟ බහු පාර්ශවිය සාකච්ඡා මාලාවකට අවස්ථාව ලබා ගැනීමට කටයුතු තීරණය විය.




# සන්නාම පිළිබඳ තොරතුරු බෙදා ගැනීමේ යුරෝපා සංචාරය

ඇඟලුම් ක්ෂේත්‍රයේ කම්කරු කාන්තාවන් මුහුණපාන ගැටලු ආමන්ත්‍රණය කරමින් ගෝලීය ජාල සබඳතා ශක්තිමත් කිරීමේ අරමුණින් Free Workers Union (FAU) ආරාධනයෙන් ඩාබිඳු සාමුහිකය හා ඉන්දුනීසියාවේ සංවිධානය පසුගිය මස 7 වැනි දින සිට මසක කාලයක් ජර්මනිය, පැරීසියේ හා ස්පාඤ්ඥයේ වැඩ සටහන් 14 ක් පැවැත්වීමට අවස්ථව උදා විය.

මෙම මහගු අවස්ථාවට ඩාබිඳු සාමුහිකයේ වැඩසටහන් සම්බන්ධීකාරිණී චමිලා තුෂාරි මහත්මිය සම්බන්ධ වු අතර ඇඟලුම් ක්ෂේත්‍රයේ කම්කරු කාන්තාවන් මුහුණ පාන ගැටලු සම්බන්ධව අවධානය යොමු කරමින් සාකච්ඡා කෙරිණී.

ඇඟලුම් සැපයුම් දාමය තුළ සන්නාම කරුවන්ගේ භූමිකාව, චර්යා ධර්ම මලා, සමාජ විගණන වල සැබෑ ක්‍රියාකාරීත්වය පිළිබඳ මෙහිදී විශේෂයෙන් සාකච්ඡාවට බඳුන් වු අතර ජීවත් වීමට සරිලන වැටුප් පිළිබඳ මෙහිදි විශේෂයෙන් සාකච්ඡාවට බඳුන් විය. ජර්මනියේ, පැරීසියේ හා ස්පාඤ්ඥයේ FAU, CNT වෘත්තිය සමිති ක්‍රියාකාරීන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් හා පර්යේෂක වරුන් ද CCC හා Tie Asia සංවිධානවල නියෝජිතයින්ද මෙම අවස්ථාවට සම්බන්ධ වු අතර මුද්‍රිත හා ගුවන් විදුලි සාකච්ඡා සඳහා ද ඩාබිඳු සාමුහිකයට අවස්ථාව උදා විය.



1 පිටුවෙන්...

## ඉල්ලීම් ප්‍රකාශනය 2019...

දින දෙකක් ඡන්දය දැමීමට යාම සඳහා කම්කරුවන්ට නිවාඩු ලබා දෙන නමුත් වාහන පහසුකම් ලබා නොදීම හේතුවෙන් සිය ගමරට බලා යාමේදී මෙන්ම ආපසු පැමිණීමේදී බහුතරයක් සේවකයින්ට විශාල අපහසුතාවයන්ට මුහුණ දීමට සිදුවේ.

එමෙන්ම ඉතාමත් අඩුවැටුපක් ලබන සේවකයින් වන අප ගම රට යන්නේ වසරකට දෙතුන් වතාවකි. එයට හේතුව ලැබෙන මුදලින් මසකට එක් වරක්වත් ඥාතීන් බැලීමට යාමට අපට නොහැකිවීමයි. මෙවැනි තත්ත්වයක් තුළ මැතිවරණ අවස්ථා වලදී ඡන්දය භාවිතා කිරීමට ගම් රට යාමට බොහෝ දෙනෙකු පෙළඹෙන්නේ නැත. මේ සම්බන්ධයෙන් අදාල පුද්ගලයින් හෝ ආයතන දැනුවත්කොට අවශ්‍ය පහසුකම් ප්‍රතිපාදන සම්පාදනය කිරීමට කැපවිය යුතු වේ.


එසේ නොමැතිනම් දැනට තාවකාලිකව පදිංචි ප්‍රදේශය තුළ හෝ සේවා ස්ථාන තුළ සිට ඡන්දය භාවිතා කළ හැකි තත්ත්වයක් නිර්මාණය කිරීමට කැපවීමෙන් අපගේ වටිනා ඡන්ද අයිතිය ආරක්ෂා කෙරෙනු ඇත.

### ජීවත්වීමට ප්‍රමාණවත් වැටුපක් සහ පදිංචියට සුදුසු පරිසරයක් නිර්මාණය කර දීම

වෙළඳ කලාපයෙහි සේවය කරන කම්කරුවකුට දැනට පවතින අවම වැටුප වන රු.15,500 ප්‍රමාණය මසකට රු.25000 දක්වා වැඩි කිරීමට ආණ්ඩු පාලකයින් විසින් කටයුතු කළ අතර, ප්‍රදේශවල ජීවත්වන ප්‍රමාණවත් පරිද්දෙන් පානීය ජල අවශ්‍යතා සහ සෞඛ්‍ය පහසුකම් නොලබන සියලුම සේවකයින්ගේ මූලික අවශ්‍යතා සැපිරෙන ජීවත්වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමට සියලු පාලකයින්, මහජන නියෝජිතයින් වගබලා ගත යුතුවේ. විශේෂයෙන් නේවාසිකාගාරවල ජීවත්වන සේවක සේවිකාවන් ඉතාමත් අනාරක්ෂිත තත්ත්වයන්ට මුහුණ දෙනු ලබයි. නේවාසිකාගාර සඳහා නිසි ප්‍රමිතියක් ක්‍රියාත්මක වන්නේ නැත. සොර සතුරු උපද්‍රවවලට මේ සඳහා අවධානය යොමු කරමින් අවශ්‍ය නීති ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට සහ ඒවා ක්‍රියාත්මක වන බවට වග බලා ගන්නා ලෙසින් ඔබ සියලු දෙනා වෙතින්ම ඉල්ලීම් කරනු ලැබේ.

### කම්කරු කාන්තාවන්ගේ ආරක්ෂාව සහ ඔවුන් මගතොටදී මෙන්ම ආයතන තුළදී මුහුණ දෙන හිංසනකාරි සිදුවීම් තුරන් කිරිම

වෙළඳ කලාපවල සේවය කරන කාන්තා ශ්‍රමිකයින්ට තම වැඩපල තුළදී විවිධාකාරයෙන් නිලධාරීන්ගේ සහ ඇතැම් සේවකයින්ගේ ලිංගික හිංසනයන්ට ගොදුරු වීමට සිදුව තිබේ. විශේෂයෙන් උසස්වීම් ලබාගැනීමේදී මෙම



නිලධාරීන් විසින් ලිංගික අල්ලස් ඉල්ලීම් යනාදියට මුහුණ දීමට සේවක කාන්තාවන් වශයෙන් අපට සිදුව තිබේ. එමෙන්ම මහමග පොදු ප්‍රවාහන සේවාවන් භාවිතා කිරීමේදී ද, බෝඩිම් කාමරවල ජීවත්වන විටදීද, ගමනාන්තය දක්වා ප්‍රවාහන පහසුකම් නොමැති අවස්ථාවල මහමග පයින් ගමන් කරන අවස්ථාවලදී ද විශාල වශයෙන් හිංසාකාරි සිදුවීම්වලට මුහුණ දෙනු ලබයි. ඇතැම් ස්ථානවල වීදි ලාම්පු පවා නොමැති තත්වයක් පවතින බැවින් වෙළඳ කලාප කම්කරු ස්ත්‍රීන්ට පූර්ණ ආරක්ෂාව සහතික කෙරෙන නීති රීති ප්‍රතිපත්ති මෙන්ම ප්‍රායෝගිකව සියලු පහසුකම් සැලසෙන පරිසරයක් නිර්මාණය කිරීමට ඔබගේ කැපවීම සහතික විය යුතු වේ.

### යහපත් සේවා තත්ත්වයන් නැතිවීම හේතුවෙන් කම්කරු කාන්තාවන් මුහුණ දෙන සෞඛ්‍ය ප්‍රශ්න ඇතුලු සියලුම ගැටලුවලට විසඳුම් ලබාදීම

වෙළඳ කලාපවල වැඩකරන කම්කරු ස්ත්‍රීන් වන අප, අපගේ ජීවිතයේ හොඳම කාලය රට වෙනුවෙන් කැප කරනු ලබයි. එහෙත් අපට සේවය කරන්නට සිදුව ඇත්තේ බොහෝ දුෂ්කර තත්ත්වයන් යටතේය. හිටගෙන වැඩකිරිමට සිදුවීම, ඉතා කුඩා ස්ටූල්වල වාඩිවී වැඩකිරිමට සිදුවීම, දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන ආයතන සේවය කරන්නන්ට පෙනහලු ආශ්‍රිත රෝගවලට භාජනය වීමට සිදුවීම, ඇතැම් ආයතනවල පැය 12ක් එකදිගට සේවය

9 වන පිටුවට...

8 පිටුවෙන්... **ඉල්ලීම් ප්‍රකාශනය 2019...**



කිරීමට සිදුවීම, ඇතැම් ආයතනවල කාන්තා සේවිකාවන් අවුරුදු 50න් පසුව අනිවාර්ය විශ්‍රාම යැවීම, ඇතැම් ආයතනවල සේවිකාවන් අවුරුදු 50ට පසුව වැඩ කරන්නේ නම් ඔවුන්ගේ සේවය මාස 6න් 6ට අලුත් කිරීම, වෙළඳ කලාපය තුළ ඇතැම් කර්මාන්තවලින් සේවකයින් වෙත සපයන ආහාර ප්‍රමිතියකින් තොරවීම හේතුවෙන් සේවකයින් නිතර නිතර ලෙඩරෝගවලට ගොදුරුවීම, ඇතැම් ආයතනවල ආහාර සඳහා දෙන විවේකය පැය කාලක් වීමද, තවත් ආයතනවල තේ විවේකය විනාඩි 7 න් ද නිම කිරීමට ද සිදුව ඇත.

ඇතැම් ආයතනවල පවතින නිෂ්පාදන ඉලක්ක දරාගැනීමට නොහැකි තරුණ සේවකයින් සිය නිෂ්පාදන ඉලක්ක වෙත ළඟාවීම සඳහා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවී සිටීම ද දැකිය හැක. නිදහස් වෙළඳ කලාපයේ සේවකයින් මුහුණ දෙන මේ සියලු ප්‍රශ්න සම්බන්ධයෙන් අවධානය යොමුකොට යහපත් සේවා තත්ත්වයක් තුළ වැඩකිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම සඳහා මෙන්ම සේවක කාන්තාවන් වෙනස්කමට භාජනය නොවන සමානාත්මතාවය තහවුරු කෙරෙන යහපත් වැඩපරිසරයක් නිර්මාණය කිරීමට ජනාධිපති අපේක්ෂකයින් වන ඔබ සියලු දෙනා කැපවිය යුතුව ඇත.

### උතුරු නැගෙනහිර පළාත් වලින් පැමිණ සේවය කරන දෙමළ සේවක සේවිකාවන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම

උතුරු නැගෙනහිර පළාත්වලින් නිදහස් වෙළඳ කලාපයට පැමිණ සේවය කරන දෙමළ බස කතා කරන කම්කරු ප්‍රජාව, තම එදිනෙදා ජිවිතයේදී බොහෝ භාෂාමය ගැටලුවලට මුහුණ දීමට සිදුව ඇත. විශේෂයෙන් කම්හලේ දී තම වැටුප් පත්‍රිකාව සිය මව්භාෂාවෙන් නොලැබීම, බස්රථවල නාම පුවරු දෙමළ භාෂාවෙන් නොතිබීම, බැංකු කටයුතු සහ පොලිස් පැමිණිලි කිරීම් යනාදියෙහිදී තම මව්භාෂාවෙන් කටයුතු කිරීමට පහසුකම් නොතිබීම යනාදී වශයෙන් වන බොහෝ දුෂ්කරතාවලට මුහුණ දෙනු ලබන අතර ඔවුන්ට මෙම රැකියා කරන ප්‍රදේශ තුළ තම භාෂාවෙන් කටයුතු කළ හැකි පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ඔබ සියලු දෙනා විසින් කැපවිය යුතු වේ.

# ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය තුරන් කිරීමේ ජාත්‍යන්තර දිනය

සමස්ථ ලෝකයේම පැතිරී ඇති කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට සිදුවන හිංසනයන්ට එරෙහිව විශේෂිත දිනයක් වශයෙන් නොවැම්බර් 25 වැනිදා නම් කර ඇත. එය දෙසැම්බර් 10 වැනිදා එනම් මානව දිනය දක්වා ගෙනයයි. අද අපේ ලෝකයේ සෑම රටකම පාහේ පුළුල්ව පැතිරී ඇති නොනැවසී පවතින මෙය මානව හිමිකම් උල්ලංඝනය කිරීම් වලින් එකකි. පොදුවේ ගත් කළ එය ශාරීරික, මානසික හා ලිංගික වශයෙන් විවිධ ස්වරූපයන්ගෙන් කාන්තාව වෙත ලඟා වේ. සමීප සහකරුගෙන් සිදුවන හිංසනයන් (පහරදීම්, මානසික අපයෝජනය, ස්ත්‍රී දූෂණය, විවාහක ස්ත්‍රී දූෂණය) ලිංගික හිංසනය හා හිරිහැර කිරීම (ළමා ස්ත්‍රී දූෂණය, පැහැරගෙන යාම්, ළමා ලිංගික අපයෝජනය, බලහත්කාර විවහා) ඒ වගේම මිනිස් ජාවරම (වහල්භාවය, ලිංගික සූරා කෑම) යන මේවා ඇතුළත් වේ. තවදුරටත් පැහැදිලි කිරීම සඳහා 1993 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් නිකුත් කරන ලද කාන්තාවන්ට එරෙහි හිංසනයන් තුරන් කිරීමේ ප්‍රකාශය, කාන්තාවන්ට එරෙහි හිංසනය අර්ථ දක්වන්නේ "ස්ත්‍රී පුරුෂ සමජභාවය මත පදනම් වූ හිංසනයේ ප්‍රතිඵලයක් ලෙස හෝ භෞතික, ලිංගික හෝ එහි ප්‍රතිඵලයක් විය හැකි ඕනෑම ක්‍රියාවක් ලෙසය. එවැනි ක්‍රියාවන් හි තර්ජන, බලහත්කාරයෙන් හෝ නිදහසේ අත්තනෝමතික ලෙස අහිමිවීම, පොදු හෝ පෞද්ගලික ජීවිතයේ සිදුවන මානසික පීඩාවන් හෝ කාන්තාවන්ට සිදුවන දුක් වේදනා මේ සියල්ල හිංසනයන් වේ. ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ වසර ගණනාවක් පුරා සාකච්ඡාවන් සිදු කරද එයට එරෙහිව ප්‍රඥාප්ති සැකසුවත් පෙරට වඩා මේ වන විට දිගින් දිගට සිදුවන්නේ ප්‍රචණ්ඩත්වයයි. කාන්තාවන් හා ගැහැණු ළමුන් තිදෙනෙකුගෙන් එක් අයෙක් තම ජීවිත කාලය තුළ ලිංගික හිංසනය අත් විඳින අතර බොහෝවිට එය සිදුවන්නේ තම සමීපතමයෙකුගෙන් වේ. තවද ලොව පුරා ඝාතනය කරන ලද කාන්තාවන්ගෙන් එක් අයකු තම සහකරු හෝ පවුලේ කෙනෙකු අතින් ඝාතනයට ලක් වී ඇත. ලොව පුරා සිදුවන මිනිස් ජවාරම් වලින් 71%ක්ම කාන්තාවන් හා ගැහැණු ළමුන් වන අතර මෙම කාන්තාවන් හා ගැහැණු ළමුන් 4 න් තුනක්ම ලිංගික සූරා කෑමට ලක් ව ඇත. අනිකුත් රටවල් මෙන්ම ශ්‍රී ලංකාවේ ද මෙම තත්වයන් තවමත් ඒ ආකාරයෙන්ම පවතී. විශේෂයෙන්ම ලංකාවේ පොදු ප්‍රවහන සේවයේ, සේවා ස්ථානයේ, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය තුළදී අපයෝජනය ගැන සිතන විට ඔවුන් බොහෝ විට ගෘහස්ථ හිංසනය කෙරෙහි අවධානය යොමු කරයි. නමුත් ගෘහස්ථ අපයෝජනයට ඇතුළත් වන්නේ සමීප සම්බන්ධතාවයක් පවත්වාගෙන යන තම සහකරුගෙන් සිදුවන හිංසාවක් වශයෙනි. ගෘහස්ථ හිංසනයේ දී ශ්‍රී ලංකාවේ වයස 15-49 අතර විවාහක කාන්තාවන්ගෙන් සියයට 17ක් ගෘහස්ථ හිංසනයෙන් පීඩා විඳිති. ජාත්‍යන්තර වශයෙන් මෙම ගැටලුව පිළිබඳ යම් යම් තීරණ ගනු ලැබුවත් 21 වන සියවසෙහි ජීවත් වන අප තවදුරටත් පීඩා විඳිනවා නොවෙද?

# සිතුවිල්ල

මේ පාර ජනාධිපතිවරණය ට අපේක්ෂකයෝ 35 දෙනෙකු පත් වෙලාලු නේ... සමහරෙක් හැලිලා මඟදීම සමහරු මාරු වෙලා... අනේ ඉතින් මේ පුංචි රට පාලනය කරන්න ඉදිරිපත් වු ඇයෝ ඇත්තෙන්ම ඔය පුරසාරම් දොඩන තරම් දේශප්‍රේමියෝ ද... මේ ලංකාව සංවර්ධනය කරන්න තියෙන උවමනාවට ඒ අය පත් වෙනවාද... නැතිනම් මේ පොඩි දූපත තවත් අගාදයකට ඇද දාන්න පත්වෙන්නෝද කියලා තේරුම් ගන්න බැරිව ජනතාව අසරණයි... ඇත්තෝ කති බොති නැත්තෝ දුක් විදිති.. අපි ගැනත් ලොක්කෝ කථාකරා නම් ඒ අපිව තවත් වහල්ලු බවට පත් කරන්නයි...

රටෙන් 1/3 ක් විදේශ විනිමය උපයන මේ ඇඟලුම් කම්කරුවෝ දිහා කවද්ද දේසපාලුවන් බැලුවේ සමස්ත කම්කරුවෝ වෙනුවෙන් කවුද වේදිකාවේ කෑ ගැහුවේ.. රටක සංවර්ධනයේ මුලික පුරුක් මේ කම්කරුවෝ නේ.. නැතුව ඔය පුටු රත් කොරන ඇමතිගොල්ලෝ නෙවෙයි.. ඒ ගොල්ලන් ඇවිදින් අවුරුදු පහක් ඉදලා පරම්පරා පහකට ඇතිවෙන්න ධනය රැස් කර ගන්නවා එත් කම්කරුවාට සතියේ ජිවත් වෙන්න රුපියල් 5000 ක් හොයාගන්න මුලු සතියේම හම්පුත්තුන්ට මෙහෙවර කරන්න ඕනා...

වේදිකාවල නැගලා දවස ගානේ කෑ මොර දෙන්නෙ නම් අරවා කරනවා මේවා කරනවා කර්මාන්තශාලා සුරපුරවල් ඇති කරනවා කියලයි... ඔය මොන පුරයන් ඇති කරත් මේ දහදුක් විදින අපේ කම්කරු අයිතීන් ගැන කතාකරන්න කවුද ආවේ... බලයට ආවට පස්සේ නැවත උපන්නා වගේ බෙරිහන් දීගෙන කියෝපුවා ඔක්කොම අමතකයි... අනේ ඒ ගොල්ලනට අමතක උනාට මේ මිනිසුන්ට ඕවා හෙඳට මතකයි... රාජ්‍ය සේවයට එක විදියක සැලකිල්ලක්.... මේ පෞද්ගලික අංශයට තවත් සැලකිල්ලක්... කම්කරුවෝ කවද්ද උද්ඝෝෂණ වලට පාරට බැස්සේ... කම්කරුවන්ට බෙදන්නේ කන් හැන්දෙන්...

අපි නම් නියම වහල්ලු තමයි... දිනකට පැය 14 වැඩ කළත් වෙනත් ගුස්පි දාලා හම්බ කරත් මාසේ ගන්න පඩිය මේ තියෙන වියදම් වල හැටියට හැරෙන්නත් මදි.. ආණ්ඩුවේම කියන විදිහට රටෙන් කාලක් මැද පෙරදිග රටවල් වල, අධ්‍යාපනයක් නැතුව රැකියාවන් නැතුව තාරුණ්‍ය හන්දි හන්දි ගානේ. එය පාලකයන්ගේ වරදක්ම නොවෙයි වහලුන් වගේ ජීවත් වීමට කැමති මිනිසුන්ගේම ප්‍රශ්ණයක්. වැඩ කරන මනුස්සයෝ කම්කරුවො කවදත් දහඩිය හෙලනවා..කියන තරම් ඔය මොන පක්ෂය ඇවිදින්වත් රටට සේවයක් ජනතාවට සේවයක් කරානම් ඇයි රටෙන් භාගයක් විදෙස්ගත වෙලා ඉන්නේ...


වේදිකාවන් තුළ කන් පැලෙන්න කෑ ගසා ගන්නවා සෙනඟ පුරවන්... තව දුරටත් මිනිස්සු වහල්ලු නෙවෙයි මේ පාලකයින්ගේ, ජනතාවගේ බදු මුදලින් සැප විදින්න තවදුරටත් ඉඩ දිය යුතු නෑ, දැන්වත් අපි කල්පනාවෙන් වැඩ කල යුතු කාලයක් නේ... රටකට අවශ්‍ය වන්නේ පුරවැසියෝ මිසක් යටත් වැසියෝ නොවේ... වැඩ ඇරිලා ගෙදරට ගොඩ වෙලා රූපවාහිණිය දාන්න කලින් ඇහෙන්නේ අරවා දෙනවා මේවා දෙනවා කියලා කෑ මොර දෙන හඬයි...

ඈ ඉතින් ඔය කියන මිනිස්සුන්ට අවශ්‍ය මුලික අවශ්‍යතා ටිකවත් දෙන්න මේ ආණ්ඩු දෙකට ඔය ටික කාලේට බැරි උනේ... පටු ආකල්ප දරන විටෙන් විට අවදානමක් එනකොට පක්ෂය මාරු කරන මේ වගේ මැති ඇමතිවරු රටට කළ සෙත මොකක්ද... රටේ ජිවනාලිය රටේ සියලු බර පැටවෙන්නේ කම්කරුවෝ මතයි. එයට වටිනාකමක් ලබා දී ඔවුන්ව මේ රටේ සමස්ත දියුණුවට එම ශ්‍රමයේ ඇති වටිනාකමට ඔවුන් සවිබල නොගන්වමින් ජිවන අරගලයට හයියක් නොවන්නට නොහැකි මේ පාලකයින් පත් කර ගැනීමෙන් ඇති ඵලය කුමක්ද...? කම්කරුවෝ වෙනුවෙන් හඩක් නැගීමට විශේෂයෙන්ම ශ්‍රමයේ වටිනාකම ලංකාවට ගෙනෙන විදෙස් ශ්‍රමිකයෝ කවුද ඒ මිනිස්සු වෙනුවෙන් ඉදිරිපත් වෙන්නේ අඩුම තරමින් ඡන්දයක් භාවිතා කිරීමටත් ඔවුන්ට අවස්ථාව අහිමි.

ඒ වගේම තමයි අපිත් මේ කලාප වලට ඇවිල්ලා ගෙවන කටුක ජීවිතය අපගේ ශක්තිය වැය කරමින් ලබාදෙන නිශ්පාදනයන්ට වටිනාකමක් තිබ්බාට අපේ දහඩියට කෝ මිලක්.. ඒ නිසාමද 71 දහසක් පමණ සේවක පුරප්පාඩු මේ කලාප තුළ පවතින්නේ.. හොදින්ම අවබෝධ කරගත හැකි පාලකයෝ කියන විදියට රැකියා මේ රටේ තියෙනවා තමයි ඔව් ඔවුන් නිවැරදි නමුත් ඒ කිසිදු රැකියාවක් කම්කරුවෙකුගේ ආර්ථියට ජීවන අරගලය ගෙනයන්න තරම් ඒ වැටුපෙන් ලැබෙන සොච්චම් මුදලින් හැකිවෙන්නේ නෑ... දේශපාලඥයින්ගේ තරගයට වගේ එකෙක්ට නොදෙනීව දවස ගානේ එළියට දාන ප්‍රතිපත්ති ප්‍රකාශන වල ඇති සුරගන කතා වලින් මිනිස්සු මඩවන්න කලින් මේවාට විසඳුම් ලබා දෙන්න...

සමන්තා

# ප්‍රහේලිකා අංක - 26




හරහට

1. වැඳීම සඳහා දෑතේ ඇඟිලි එක්කොට තබා ගන්නා ඉරියව්ව.
4. තට්ටු - මහල් යන අරුත ඇති පදයකි.
6. ඇලීම්, බැඳීම් ආදියෙන් වෙන් වී සිටීම.
7. ප්‍රමාණය නිශ්චය කරන ලද යන අර්ථය හෝ සම්මත මිම්මකට අනුකූල වූ යන අර්ථය ලැබේ.
9. තෙල් සිඳීම සඳහා භාවිතයට ගන්නා ලද පැරණි යන්ත්‍රයකි.
10. යම් දෙයක් කිරීමට ලබා ඇති පළපුරුද්ද
11. නමස්කාරය යන අරුත දෙන පදයකි.

පහළට

1. කතෝලික දේවස්ථානයේ භාරකරු මෙසේ හැඳින්වේ.
2. ජනතාව අතර කටින් කට පැවත එන කවි කතා විශ්වාස ආදි දේ හැඳින්වෙන්නේ මෙසේය.
3. කිසියම් බලයක් උපයෝගී කරගෙන ක්‍රියාත්ම කරන උපකරණ විශේෂයකි.
5. හැකිලු
7. යම් පූජ්‍ය වස්තුවකට ගෞරව දැක්වීම පිණිස සම්මත පිළිවෙලකට එය වටා යෑමේ ක්‍රියාවලිය.
8. විරුද්ධකාරයකුට අයහපතක් සිදුවීමට කරන පැතුමකි.

**මෙම ප්‍රහේලිකාව නිවැරදිව පුරවා මෙම ලිපිනයට එවා තෑගි දිනන්න.**
**ඕබිඳු සාමූහිකය**
**221, වෙළබඩ පාර, කටුනායක.**

2 පිටුවෙන්... **ඇය...**


ගැහැණියක් වශයෙන් සැමියාගේ දරුවන්ගේ ඇයගේ දෙමාපියන්ගේ දක්වා සියලු කටයුතු මනා කළමණාකරණයකින් යුතුව සිදු කරනවා සේම සකසුරුවම් කරගත් දෑ යොදවමින් වගකීමෙන් කාන්තාවන් වශයෙන් ඒ බුද්ධිය සිහිපත් කර අවදි කරවන්නට ඔබට හැකි බවත් එයින් ඔබගේ ජීවිතය වෙනදාට වඩා හරවත් කර ගැනීමට උත්සහා කිරීමකි.

සියල්ල එක් මොහොතකින් සුනාමියක් මෙන් ගසාගෙන යන විට පවා ඔබට නොසෙල්වී සිටීමට හැකි මුත් ඒ බලය පිළිබඳ හඳුනා ගැනීමට ඔබ උත්සහ ගතයුතුය. සියලු දේ ඔබේ හිස මත කඩා වැටෙන විට ඒවාට නොබියව මුහුණ දෙන්න පලිහක් ඔබ තුළ පවතී. වඩා යෝග්‍ය වන්නේ ඒ කුමක්දැයි නිවැරදිව හඳුනා ගැනීමයි. වසන්තය නිතරම අප අසල රැඳෙන්නේ නැත. සියල සෘතු වලට මුහුණ දෙමින් වසන්තය කරා යා යුතුයි.

අත් හරින්නට හැකි සියල්ලම අත් හැරීමත් ඒ සියල්ල දිහා උපේක්ෂාවෙන් බලා සිටීමටක් අධිෂ්ඨානයෙන් සියල්ල දරාගෙන ධනවාදී ලෙස සිතමින් දෑස් යොමු කිරීමෙන් ගැහැණියට ඇයගේ ගමන් මර්ගය වෙත බාධාවන් ඉවත් කර පිළිසකර කර ගනිමින් දිර්ඝ ගමනක් යාමට හැකියාව ඇත. සියල්ල වෙනස් වන සුලු බවත් අනිත්‍ය බවත් සත්‍යකි. මද සුළඟටත් වැනෙන නමුත් තද සුළඟක දි පවා කඩා නොවැටෙන උණ ගස සේ ගැහැණිය ශක්තිමත්ය. අප සෑම විටම අප වටා ඇති දෑ අහිමි වෙතැයි බියෙන් පසු වේ.

ගැබ් ගැනීම වේදනාවක්, දරුවෙකු බිහි කිරීමේ වේදනාවක්, තම දරුවන් හඬනු දැකීම වේදනාවක් දරුවන් අසනීප වීම වේදනාවක් ඉතින් දරු ගැබක් කුසේ හටගත් දා පටන් ඇය විඳින්නේ අනේකවිධ වේදනාවන් වුවත්, ජීවිත කාලය පුරාම සතුටෙන් සිනහාවෙන් දරුවන් හදවතේ දරාගන්නේ ඇයයි. ඇත්තේන්ම ගැහැණිය විශිෂ්තම වස්තුවකි..

මනීෂා ප්‍රනාන්දු



# බලයට, ධනයට වහල් නොවී...

රටක් පාලනය කිරීම සඳහා ජනාධිපති, අගමැති ඇමති මණ්ඩලයක් පත්වන්නේ මහ ජනතාවගේ කැමැත්ත පරිදිය. විවිධ ජාතීන් අප රට තුළ ජීවත් වන හෙයිනි ඔවුන්ගේ මානව අයිතිවාසිකම් සුරැකීම සඳහා ජාතිබේදයෙන් තොරව පාර්ලිමේන්තුව තුළ මැති ඇමතිවරු පත් කරගනු ලබයි.

මුල් කාලයේ අප රට විදෙස් පාලනයට නතු වී තිබූ අතර එයින් මිදී 1948 දී පූර්ණ නිදහසක් ලබා ගැනීමට අපට හැකිවිය. විවිධ රජවරුන්ගේ පාලනයක් රට තුළ තිබිණි. ඉන් පසු රජවරු විසින් රට පාලනය කළේ විනයක් ඇතිව හා එකිනෙකාට ගෞරව කරමිනි. එමෙන්ම රට සහලින් පෝෂණය කිරීම සඳහා වැව් අමුණු ඇළදොළ, ගංගා හා බෞද්ධ දර්ශණය රැක ගැනීම උදෙසා විශාල දාගැබ් වෙහෙර විහාර ඉදි කළේය. බුදුන් වැඩි තැන්ද ආරක්ෂා කරමින්ය.

ඉන් පසු රට පාලනය කළේ රදළ පැලැන්තියෙන් එන ප්‍රභූවරුන්ය. ජේ.ආර්. ජයවර්ධන, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බාණ්ඩාරනායක, සිරිමාවෝ බණ්ඩාරනායක, වැනි අය වලව් කාරයින්ය. ඒ නිසා ඔවුන්ට රට සූරා කෑමටත්, රටේ දේපල විදෙස් රට වලට විකිණීමටත්, කෝටි ගණන් සොරා ගැනීමටත් ඔවුන්ට අවශ්‍යතා නොවීය.

කෘෂි ආර්ථිකයක් මත සංවර්ධනය වූ ශ්‍රී ලංකාව තේ, පොල්, රබර් හා කුළු බඩු ආදිය විදෙස් රටවලට අපනයනය කරලීය. ඒ තුළින් මූලිකව විදේශ විනිමය මෙරට ලබාගනු ලැබීය. තවද ආචාරධර්ම පද්ධතියක් තුළ වැඩකල අතර නීතිය ද අකුරට ඉටු කළ බව ඉතිහාසය පෙන්වා දෙයි. නිදසුන් ගත් කළ රාජ්‍ය ද්‍රෝහී වූවායැයි.. ඇහැලේපොළ කුමාරිහාමි හා ඇගේ දරුවන් සියලු දෙනා රාජ්‍යය නීතියට අනුව මරණ දඩුවම හිමිවිය.

නමුත් අද පවතින රාජ්‍ය පාලනය තුළ එවැන්නක් දැකිය නොහැක. එකිනෙකාට මඩ පහරවල් ගසමින් දස දහස් ගණන් වියදම් කර මහජනතාවගේ කර පිටින් පාර්ලිමේන්තුව තුළට යන මැති ඇමතිවරු කරන්නේ මහජනතාවට සේවය කරනවාට වඩා තම තමන්ගේ මඩිය තර කර ගැනීමය. ආර්ථිකයේ බර දරන්නෙ මහජනතාවය. බදු බර අහස උසට නැගී ඇත. දිනෙන් දින අත්‍යවශ්‍ය බඩු වල මිල ඉහළයාමේ නිමක් නැත. පෞද්ගලික අංශ වල සේවය කරන අයගේ වැටුප් තල අවම තත්වයකි. රජයෙන් ලැබෙන වරප්‍රසාද ඔවුනට හිමි නැත. මෙවන් තත්වයක් තුළ වැනි ඇමතිවරුන්ගේ වැටුප් තවත් ඉහළ දමා ගැනීමට සැරසෙති.

අද පාර්ලිමේන්තුව තුළ ප්‍රශ්ණ විසදන්න දඟලන හැටි මාධ්‍ය තුළින් දිනපතා දක්නට ලැබේ. ඔවුන් භාවිතා කරන වචන, නින්දිත ලෙස හැසිරීම ගහ බැන ගැනීම් යනාදිය අද පොඩි දරුවන් පවා දන්නා කරුණකි.

රාජ්‍ය බලය ලබාගැනීම උත්සුක වන්නේ තමන්ගේ පවුල් රැක ගැනීම උදේසා මිස රට තුළ ජීවත් වන දුගී පවුල් වලට ඒ අදායම් ගලා නොයන්නේය.

ජනාධිපති වරණයක් ලඟම පවතී. තවමත් පක්ෂ තුළ නිශ්චිත කෙනෙකු තෝරාපත් කර ගැනීමට වලිකන්නේ එකිනෙකාට උපහාස කර ගනිමිනි. බලයට ධනයට වහල් ගැති නොවී ජනතාවට සේවයක් කිරීම පිළිබඳ ඉතිහාසය පෙන්වා දී ඇත. ඒවැනි යුගයක් නැවත රට තුළට ලැබේද යන්න උභතොකෝටික ප්‍රශ්ණයකි.

එච්.අයි. සමන්මලී

අංක: 221, වෙළඹඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදි.